# වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

# ප්‍රසම්පාදන දැන්වීම

## නේවාසිකාගාර සඳහා නිවාස ගොඩනැගිලි කුලියට/බද්දට ලබා ගැනීම

01. සභාපති, ප්‍රසම්පාදන කමිටුව, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, විසින් පහත කාර්යය සඳහා සුදුසුකම් සපුරා ඇති පිළිගත් ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

| ලංසුවේ නම | ලංසු අංකය | ලංසු පත ලබා ගැනීමට ගෙවිය යුතු මුදල (ආපසු නොගෙවන) |
|---|---|---|
| ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා නිවාස ගොඩනැගිලි කුලියට/බද්දට ලබා ගැනීම (කි.මී. 10 ඇතුලත) | UoVT/SUP/NCB/03/05/I/2025 | 1,000 |

02. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය යටතේ පැවැත්වේ.

03. සුදුසුකම්ලත් අභිලාෂී ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා දුරකථන අංක - **011-2630733** මගින් ප්‍රසම්පාදන නිළධාරී, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය ඇමතීමෙන් **2025 ජූලි මස 01** වන දින සිට **2025 ජූලි මස 14** වන දින දක්වා **පෙ.ව. 9.00 සිට ප.ව. 2.00** කාලය තුළ (සතියේ වැඩ කරන දිනයන්හි) විමසීම් සිදු කළ හැක.

04. අභිලාෂී ලංසුකරුවන්හට ලංසු ලිපි ලේඛණ කට්ටලයක් ආපසු නොගෙවනු ලබන ගාස්තු ගෙවීමෙන් (ආපසු නොගෙවනු ලබන ගාස්තු, ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් වෘත්තීය තාක්‍ෂණ විශ්වවිද්‍යාලයේ ලංකා බැංකුව, රත්මලාන ශාඛාවේ ගිණුම් අංක **0070308457** ට බැර කළ යුතු අතර, එම ලදු පතෙහි පිටපතක් ලංසුව සමග අමුණා එවිය යුතුය) හා ප්‍රසම්පාදන නිළධාරී, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, **2025 ජූලි මස 01** වන දින සිට **2025 ජූලි මස 14** වන දින දක්වා වැඩ කරන දිනයන්හි **පෙ.ව 9.00 සිට ප.ව. 2.00** දක්වා ලබාගත හැක.

05. ලංසු පත් **2025 ජූලි මස 15** වන දින **ප.ව. 2.00** ට පෙර විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයට ලැබෙනසේ "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, අංක 100, කඳවල, රත්මලාන යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ විශ්වවිද්‍යාලයීය සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය තුළ තැන්පත් කළ යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි **"ප්‍රසම්පාදන අංකය, ප්‍රසම්පාදනයේ විස්තර, ලංසුපත් විවෘත කිරීමේ දිනය"** සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. **2025 ජූලි මස 15** වන දින **ප.ව. 2.00 ට** ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහුගේ අධිකාරී බලයලත් නියෝජිතයෙකුට (බලය පවරන ලද ලිපිය සමග) සහභාගි විය හැක.

07. ඕනෑම අවස්ථාවක ඇති එක් ලංසුවක් හෝ ලංසු කිහිපයක් හෝ ලංසු සියල්ල භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සියලු හිමිකම් විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව සතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය,
අංක 100, කඳවල,
රත්මලාන.

Tel: 0112630733
Fax: 0112630738
Web: www.uovt.ac.lk

2025 ජූලි මස 01 දින.